# ලක්දිව බුදුදහම සුරකින බොදුපවුර ගොඩනගමු

නිරෝෂිකා ලියන මුහන්දිරම්[1]

## හැඳින්වීම

බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මයේ හරය පිඬුකර දක්වන්නේ නම් එය " චතුරාර්ය සත්‍යය" අවබෝධ කර සසර දුකින් නිදහස්වීමට පිළිවෙත් පිරීමයි. බුදුවරුන් පහළ වන්නේ බියකරු සසර මගක යන සත්ත්වයන් එම සනාතන දුකෙන් මුදවාලීම පිණිස චතුරාර්ය සත්‍ය ධර්මය හෙළි කරදීමටය. තෘෂ්ණාවෙන් බැඳුණු තැන සසර බවත්, ඉන් මිදුණු තැන නිවන බවත්, නිවන සාක්ෂාත්වීමට ආර්ය අෂ්ටාංගික මාර්ගය ප්‍රගුණ කළයුතු බවත්, බුද්ධ දේශනාවෙන් තොරව දෙවි මිනිසුන්ට කිසිදා දැනගත නොහැකිය. එහෙයින් බුද්ධකෘත්‍ය වන්නේ සමාජ යහගුණ මතු කිරීම ඉක්මවාලන චතුරාර්ය සත්‍යය අවබෝධ කර දුක්ඛිත සසර ජය ගැනීමයි.

මෙම බුද්ධ කෘත්‍ය පහදාදීමෙන් තොරව (ගිහි-පැවිදි) අනුගාමිකයන් දරන පුද්ගලික මත හුවාදැක්වීමෙන් නූතනයේදී බුදුමග ප්‍රබල පසු බැස්මකට ලක්ව ඇති නිසා ලංකාවේ බුදු දහම ප්‍රවර්ධනය කිරීමට හේතුවන බහුවිධ ක්‍රමවේදයන් හඳුනා ගැනීම වඩා කාලෝචිත වේ.

දැනට වර්ෂ 2559කට පෙර දඹදිව පහළ වී වදාළ ගෞතම බුදුන් වහන්සේගේ දහම් පණිවිඩය බුද්ධ පරිනිර්වාණයෙන් වසර 300 කට පමණ පසු අශෝක අධිරාජ්‍යාගේ (ක්‍රි. පූ 273- ක්‍රි. පූ. 232) ධර්ම ප්‍රචාරක වැඩ පිළිවෙළෙහි ප්‍රතිඵලයක් ලෙස ලක්දිවට දායාද විය. දේවානම්පියතිස්ස රජු (බු.ව. 307- බු.ව. 267) බුදුදහම වැළඳ ගැනීම, ස්ථිරව මුල්බැසගත් ආගමික විශ්වාසයක් නොමැති වූ ලක්වැසියන් බුදුදහම වැළඳ ගැනීම සහ අරිට්ඨ කුමරු, අනුලා බිසව ලක්දිව සම්බුදුසසුනේ පැවිදි පිළිවෙත් පිරීම නිසා ලක්දිව ගෞතම සසුන මුල්බැස ගත්තේය.

ගෞතම සසුනේ "මහා සෑය" හෙවත් ස්වර්ණමාලිසෑය ගාමිණී අභය මහා නිරිඳුන් (ක්‍රි. පූ. 161-ක්‍රි. පූ. 137) ලක්දිව ඉදිකිරීම, බුදුන් උපන් බිමට බෝධීන් වහන්සේ අහිමි වුවද දක්ෂිණ ශාඛාව අනුරපුරයේ පිදුම් ලැබීම, දළදා වහන්සේ මැද මහනුවර වැඩ හිඳීම ගෞතම සසුනේ බුද්ධ රාජ්‍ය ලංකාව බවට තවදුරටත් තහවුරු කර ඇත. අරිට්ඨ මහ රහතන් වහන්සේගෙන් හා අනුලා රහත් තෙරණියගෙන් ඇරඹි ලක්දිව භික්ෂු භික්ෂුණී පරපුර අද දක්වා දිවි දෙවෙනි කොට බුද්ධ වචනය

[1] කථිකාචාර්ය (පරිවාස), නීති අධ්‍යන අංශය, ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය, නාවල, imniroshika@gmail.com

ආරක්ෂා කර ඇත. එසේම මහා පරාක්‍රමබාහු රජු කළ ශාසනශෝධනය, ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම, වැලිවිට සරණංකර හිමි සියම් දේශයෙන් උපසම්පදාව වැඩමවීම ලක්දිව බුදු දහම තවත් ඔපවත් කළහ.

**ක්‍රමවේදය**

සම්බුද්ධ ජයන්තියට වසර 2600 ක් සැපිරෙන විට ලක්දිව බුදු දහමේ ප්‍රවර්ධනය සඳහා හේතු වන බහුවිධ විධික්‍රම සෙවිය යුතුවන්නේ කුමක් නිසාද? බුදු දහමේ තිරපැවැත්මට අභියෝග රාශියක් එල්ල වී තිබීම එයට හේතුවයි. මේ අනුව ලක් බුදු දහමේ අනාගතය, වර්තමාන සමාජය තුළ බුදුදහමට ඇති අභියෝග නිරීක්ෂණය තුළින් විමසා බැලිය යුතුය.

**ප්‍රතිඵල සහ සාකච්ඡාව**

ලක් බුදුදහමට එල්ලවී ඇති අභියෝග අභ්‍යන්තර හා බාහිර අභියෝග ලෙස ආකාර දෙකකින් මෙම අධ්‍යනය හඳුනා ගනියි.

අභ්‍යන්තර අභියෝගය වන්නේ මූලික බුද්ධ දේශනා පරිශීලනය නොකිරීම හා ධර්ම දේශනා සඳහා මූලික බුද්ධ දේශනා පාදක කර නොගැනීම නිසා සසර බිය නොදැනීයාමයි. එහි ප්‍රතිඵලය වන්නේ ගිහි පැවිදි දෙපිරිසම පිළිවෙත් පිරීමෙන් ඈත්වීම නොහොත් සසර දුකෙන් මිදෙනු වස් චතුරාර්ය සත්‍යාවබෝධ කිරීමේ වැඩපිළිවෙළ ඒකායන ජීවිත අපේක්ෂාව කර නොගැනීමයි.

හිස ගිනිගත්තෙකු ඒ ගිනි නිවීමට දරන උත්සාහය දෙවැනි කොට සසරින් එතෙරවීමට පිළිවෙත් පිරීම මුල් වියයුතු බව සම්බුද්ධ දේශනාව වුවද කිසිඳු සම්බුද්ධ දේශනාවක නොවන සසර සැරිසරා පාරමී ධර්ම සම්පූර්ණ කර නිවන් සාක්ෂාත් කිරීම වත්මන් බෞද්ධ අපේක්ෂාව වී ඇත. බුදුරදුන්ගේ හා ධර්මයේ නාමයෙන් පුද්ගලික අදහස් හුවා දක්වාලීම තුළ සිල් රකිමින්, සමාධිය ප්‍රගුණ කරමින් හා ප්‍රඥාව වඩමින් වාසය කළයුතු පැවිදි පාර්ශවය ආර්ය ශ්‍රාවකත්වයෙන් ඉවත් වී ඇත. එනම් තෘෂ්ණාවෙන් ඇලුණ සසරින් මිදීම සඳහා නිවනට ඒකායන මඟ වන ආර්ය අෂ්ටාංගික මාර්ගය තුළ වාසය කිරීම සිදු නොවේ. බුදුන් වහන්සේ වදාළ පරිදි නැවේ බර නිසා නැව ගිලෙනා ආකාරයට ශාසනය අතුරුදහන් වන්නේ පිටස්තර බලවේගයකින් නොව නිසි මග නොගත් සිව්වනක් පිරිසෙන් සිදු වන විපත නිසාවෙනි.

ලක්දිව බුදු දහමට එරෙහි බාහිර අභියෝගය වන්නේ අන්‍යාගමික පවිටු බලවේග විසින් සසුන විනාශ කිරීමේ අරමුණින් ක්‍රියාත්මක කරන බලවේගයන්ය. අශෝක අධිරාජ්‍යයා ධර්ම ප්‍රචාරය කළ රාජ්‍ය නවය වෙතින් බුදු දහම අතුගා දැමුවේ ආක්‍රමණකාරී බලවේග මිස රටවැසියන් වෙනත් ආගම් වැළඳ ගැනීම නොවේ. අද වනවිට රාජ්‍ය පිළිගැනීමෙන් ථේරවාදී බුදු දහම ඉතිරිව ඇත්තේ ශ්‍රී ලංකාව, තායිලන්තය, ලාඕසය, මියන්මාරය හා කාම්බෝජය යන රටවල පමණි.



BHIKSHU UNIVERSITY OF
07 APR 201

ඒ අතුරින් ශ්‍රී ලංකාව ගෞතම බුදුන්වහන්සේගේ මුලික දේශනාව ඒ ආකාරයෙන් ම ආරක්ෂා කරමින් සසුනේ උරුමය ද සුරකින ලොව ප්‍රබල ම රාජ්‍යය වේ.

මෙම අධ්‍යනයෙන් දක්වන්නේ බාහිර අභියෝග තීරණාත්මකව පරාජය කිරීමට නම් අභ්‍යන්තර අභියෝග ජය ගතයුතු බවයි.

අරහත් ධජ සිවුරු දරමින් උජුපටිපන්න මග යායුතු මහ සඟරුවන සරල සාමාන්‍ය ගිහියන් මෙන් අධ්‍යාපනය හදාරා රැකියා කරමින්, ව්‍යාපාර කටයුතු හා දේශපාලනයේ නියැලෙමින් ආර්යමග අත්හළේ ද එතැන සිට වත්මන් ශාසනික ඛේදවාචකය ඇරඹි බව මෙම අධ්‍යනයේ තර්කනයයි. ගිහි නායකයින්ගෙන් කෑමොර ගසා ඉල්ලීම් ලබාගන්නට තරම් අද පැවිදි උතුමන් අසරණය. මෙනිසා ගිහි ශ්‍රාවකයන්ගේ නමස්කාර පූර්වක භක්තිමත් සැලකීම පැවිදි උතුමන්ට අහිමිය.

**යෝජනා සහ නිගමන**

මෙම අධ්‍යනයට අනුව බුදුදහම සුරැකීමේ ප්‍රමුඛතම වගකීම පැවරෙන්නේ ගිහි නායක කාරකාදීන්ටය. සියලු ධර්ම සංගායනාවලට අනග්‍රහය ලබාදෙමින් සසුන සුරක්ෂිත කිරීමේ දී ශ්‍රද්ධාවන්ත රාජරාජ මහාමාත්‍යාදී ගිහි පිරිස් දායකත්වය දැක්වූ බවට ඉතිහාසය සාක්ෂි දරයි. වත්මන් ශ්‍රී ලංකාවේ සියම්, අමරපුර හා රාමාඤ්ඤ ලෙස ත්‍රෛනිකායන් ප්‍රධාන මහෝපාධ්‍යයන් වහන්සේලා තිස් දෙනමක් විසින් පැවිදි උපසම්පදාව ලබා දෙමින් කරන ශාසන කටයුතු උදෙසා පාලකයින් සෘජු අනුග්‍රහය ලබාදිය යුතුමය.

භික්ෂුව ආර්ථික ක්‍රියාවලියට දායක වෙමින් මුදල් පරිහරණය කිරීමට පෙළඹුනේ සිව්පසයෙන් ඇප උපස්ථාන කරමින් සසුනේ වැඩ පිණිස ගිහිකාරකාදීන්ගෙන් ලැබෙන මැදිහත් වීම ප්‍රමාණවත් නොවීම හේතුවෙනි. අභ්‍යන්තර අභියෝගයට පාදක වන්නේ එයයි. සිවුපසය, මාසික දන්වැට සහ භික්ෂූන් වහන්සේලාගේ සියලුම කුඩු මහත් කටයුතු රාජ්‍ය මැදිහත් වීමෙන් ඉටු කළ යුතුය.

චේතියගිරියේ අටසැට ලෙන සිට සුනහත පිරිවෙන, දීපචංකමන පිරිවෙන, තිස්සමහාරාමය, සිතුල්පව්ව මහා විහාරය, ලෝවාමහාපාය වැනි බෞද්ධ විහාරංග ඉදිකළ යුගය නැවත සිහිගන්වමින් ශාසනයේ ආරක්ෂකයින් හා උරුමකරුවන් ලෙස ශාසනික කාර්යභාරය රජය ඉටු කළ යුතුය.

මෙයට නොදෙවෙනි වගවීමක් පැවිදි උතුමන් වහන්සේලාටද පැවරේ. උපසම්පන්න භික්ෂුව ප්‍රාතිමෝක්ෂ සංවර සීලය දිවි දෙවනිකර සුරකිමින් ආර්ය අෂ්ඨාංගික මාර්ගය තුළ සතර සම්‍යක් ප්‍රධාන වීර්යයෙන් යුක්තව සතර සතිපට්ඨානයේ සිහිය දියුණු කරමින් මගඵල පිණිස ම වෙහෙසෙමින්, ගිහි ශ්‍රාවකයන්ට දුකින් එතෙර වීමේ මග කියා දිය යුතුය.

ලක්දිව බුදු දහමේ චිරස්ථිතිය උදෙසා කටයුතු කිරීම යන්න මතු කළ සැනින් සමාජ මනස යොමු වන්නේ මුස්ලිම් අන්තවාදය දෙසටය. එය මෙම අධ්‍යනයට අනුව ප්‍රශ්නයට මැදින් ප්‍රවේශ වීමකි. ගෞතම බුදු දහම ලක්දිව යළි බැබලවීමට නම් ඉහත කී අභ්‍යන්තර අභියෝග ජය ගැනීම දෙසට නැඹුරු වූ වැඩපිළිවෙලකට ප්‍රවේශ විය යුතුමය. එය සිදු නොකරන තාක් දුරට සම්බුදු සසුනට ඇති අනතුරු පහව නොවනු ඇත.

**ප්‍රමුඛ පද:** චතුරාර්ය සත්‍යය, බුද්ධකෘත්‍ය, ආර්ය අෂ්ටාංගික මාර්ගය, ආර්ය

**ආශ්‍රිත ග්‍රන්ථ**

සංයුක්ත නිකාය. දේවපුත්ත සංයුක්තය. අනාථපිණ්ඩික වග්ගය- වසුදත්ත සූත්‍රය.

සංයුක්ත නිකාය. කාශ්‍යප සංයුක්තය. සද්ධම්මසතිරූපක සූත්‍රය.

ධීරානන්ද හිමි, හඟුරන්කෙත, (2004). *රාජ්‍යත්වය, රාජ්‍යය සහ ආගම*. ආරිය ප්‍රකාශකයෝ

Karunaratne, W.S.(1988). *Buddhism: It's Religion and Philosophy*. Buddhist Research Society.